# ආරෝග්‍ය ශාලාව හා බැඳි පාරිසරික උපයෝගීතාව(මිහින්තලය පැරණි ආරෝග්‍ය ශාලාව ඇසුරින් සිදුකරනු ලබන පාරිසරික පුරාවිද්‍යා අධ්‍යයනයක්)

## දීර්ඝ සාරාංශය

එච්.එම්.එන්. තාරුකා හේරත්[1], පී.ඩී.ආර්. පියුමාලි සෙනවිරත්න

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ස්වස්ථාව පිළිබඳව විවිධ මූලාශ්‍රයන් මගින් කරුණු හෙළිකර ගත හැකිය. ඒ අතර වංශ කතා ශිලා ලේඛන මෙන්ම පුරාවිද්‍යාත්මක පුරාණ මූලාශ්‍රයෝද වෙති. ලංකාවේ විවිධ ස්ථානවලින් හමුවන පැරණි රෝහල් පිළිබඳව සාක්ෂි මෙරට පුරාතනයේ සෞඛ්‍ය ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන ප්‍රධානතම පුරාවිද්‍යාත්මක සාක්ෂියයි. පුරාතන පරිසරය හා බද්ධ වුණු ක්‍රියාවලියන් මෙම පැරණි රෝහල් ආශ්‍රයෙන් පැවති බව හඳුනාගැනීමට පුළුවන.

### අරමුණු

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ මිහින්තලේ පැරණි ආරෝග්‍යශාලාව හා බැඳි පාරිසරික උපයෝගීතාවය හඳුනාගැනීම වේ. සෙසු අරමුණු ලෙස විවිධ කාර්යයන් සඳහා පාරිසරික සම්පත් උපයෝගී කර ගැනීමට බලපා ඇති සාධක විමසා බැලීම අපේක්ෂා කෙරේ.

### පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා මූලාශ්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර ගවේෂණය යන ක්‍රමවේදයන් දත්ත රැස්කිරීම සඳහා යොදාගැනිණ. එසේ රැස්කරගන්නා ලද දත්තයන් පරිසරය හා බද්ධව විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී. දත්ත ඉදිරිපත් කිරීමේ දී ඡායාරූප හා දත්ත වගු භාවිත කිරීම අපේක්ෂා කෙරේ.

### ප්‍රතිඵල සාකච්ඡාව

ක්‍රිඃව අට වන සියවසෙහි II වන සේන රජු විසින් පැරණි ආයුර්වේද රෝහල ඉදිකර තිබේ. මිහින්තලයේ වැඩ විසූ 2000 ක් පමණ භික්ෂූන්වහන්සේලාහට සෞඛ්‍ය පහසුකම් සැළසීම උදෙසා මෙම ගොඩනැගිල්ල ඉදිකර ඇත. දිගින් හා පළලින් මීටර් 118.6 × 97.6 ක විශාල වූ ආයත චතුරස්‍රාකාර ගොඩනැගිල්ලක් වූ මෙහි මැද මිදුලක් ද එහි මධ්‍යයේ ටැම්පිට විහාරයක මෙන් බුද්ධ ප්‍රතිමා ගෘහයක් ද විය. ප්‍රධාන ද්වාරය දකුණු දිගින් සහ අනුද්වාර දෙකක් ඊසාන දිගින් පිහිටා තිබේ. සෙසු පැරණි රෝහල්වල ව්‍යූහයට සමානවන මෙහි මැද මිදුලට සහ බුදු මැඳුරට මුහුණලා රෝගින්ගේ ගිලන් නේවාසික කුටි පිහිටුවා තිබේ. කුටීර දෙකකට එක් පියගැට පෙලක් යොදා මැද මිදුලට පිවිසිය හැකිය. ප්‍රධාන ගොඩනැගිල්ල පිටත හා ඇතුළු යන මණ්ඩප දෙකකින් යුක්ත වේ. පිටත මණ්ඩපය ඇතුළු මණ්ඩපයට වඩා විශාලවන අතර මධ්‍යයේ ඇති දොරටුවකින් විවෘත මණ්ඩපයට පිවිසිය හැකිවේ. විවෘත මණ්ඩපයේ නැගෙනහිර භාගයේ මුළුතැන්ගෙය විය. මුළුතැන්ගෙයට ඉදිරියෙන් පිහිටුවා ඇති ගල් කණු මගින් ඉදිරියට පියස්සක් පැවතිබව සිතිය හැක (ගමගේ, 2004). වෙදහලේ දකුණු පස කුටීරයේ ජන්තාඝරයකි. එහි මධ්‍යයේ අවකාශය සහිත භූමියේ විශේෂයෙන් සැකසූ ස්ථානයක ඖෂධ යුෂ සහිත උණුදිය සහ සිසිල් දියෙහි රෝගීන් ගිල්වා තැබීමෙන් හෝ නැහැවීම මගින් ප්‍රතිකර්ම කළ ක්‍රමයක් සහ ඇඹරුම් ගල් මගින් විවිධ ඖෂධ වර්ග නිෂ්පාදනය කළ බවත් පැහැදිළිය (ලගමුව, 2014).

මෙම ස්ථානය හඳුනාගත හැකි හොඳම ලක්‍ෂණය වනුයේ එහි එක් කෙළවරක දක්නට ලැබෙන බෙහෙත් ඔරුවයි. පුද්ගලයෙකුට ගිලා බැස වැතිරෙන්නට හැකි ආකාරයෙන් මෙම ඔරුව නිර්මාණය කොට තිබේ. මෙම ආරෝග්‍යශාලාව කරවීමේ ගෞරවය හිමිවන්නේ ක්‍රි.ව. නව වන සියවස පමණ මෙරට පාලනය කළ දෙවන සේන රජතුමාටය. ඒ පුවත මහාවංශයේ 51 වන පරිච්ඡේදයේ 73 වන ගාථාවේ සදහන් ය. ඒ " වෙජ්ජසාලංච කාරේසි චේතියම්හි ගිරිම්හිසෝ..." යනුවෙනි. වර්තමානය වන විට මෙහි හඳුනා ගත හැකි වන්නේ බිම් සැලැස්ම එක් දොරටුවක් හා කණු කිහිපයක් පමණි. එමෙන්ම මෙහි හතරැස් කාමර කිහිපයක් හා මධ්‍යයේ මළු කිහිපයක් හඳුනාගත හැකි ය. බෙල් මහතා දක්වා ඇති විස්තරයට අනුව දකුණු දිශාවට මුහුණලා ඇති මෙම ගොඩනැගිල්ල බටහිර සිට නැගෙනහිරට දිගින් අඩි 118 අඟල් 06ක් ද පළලින් උතුරේ සිට දකුණට අඩි 97 අඟල් 06ක් ද වේ. නැගෙනහිර, උතුර හා දකුණු දිශාවට ඇති අද්දර බිත්ති එක් පැත්තකට 07 බැගින් කුඩා කුටිවලින් සමන්විත වේ. දෙකෙලවර ඇති කුටි අනෙක් ඒවාට වඩා දෙගුණයක් විශාලය. පිටුපස කුටි 9ක් වේ. වෙදහලට ඇතුල්වන ස්ථානය ප්‍රධාන තැනක් ගනිමින් එහි එක් පැත්තකට කුටි 04 කි වේ. මෙම කුටි සියල්ල මුහුණලා ඇත්තේ ගොඩනැගිල්ලේ ඇතුළු පැත්තට ය. එක් කුටියක් වර්ග අඩි 10ක් වන අතර සෑම කුටියක්ම ඉදිරියෙන් පටු මගක් ඇතිවන සේ ගොඩනැගිල්ලේ බරාඳය සකස් වී ඇත. උතුරු නැගෙනහිර දිශාවට මුහුණ ලා තබා ඇති ගල් ඔරුවකි. එය දිගින් අඩි 07 ක් වන අතර පළලින් අඩි 02යි අඟල් 06 කි. එහි වැතිර සිටින්නෙකුට හිස තබා ගැනීමට හැකිවන අයුරින් කොටසක් වෙන්කර කපා ඇත. උරහිස කොටසේ ප්‍රමාණය අඩි 01 යි අඟල් 07 ක් වන අතර පාද කොටස අඩියක් පළල වේ (පරණවිතාන 1962). මෙයට අමතරව තවත් කුඩා බෙහෙත් ඔරුවක් හා ඇඹරුම් ගල් කිහිපයක් දක්නට ඇත. ශාකමය ඖෂධයන් ඇඹරීම, කුඩු කිරීම හා කෙටීමට එම උපකරණ භාවිතා කර ඇත (හේරත්, 2005). ආරෝග්‍යශාලාව අසළ කළ කැනීම් වලදී ලෝහ භාවිතයෙන් සකස් කරන ලද ශල්‍ය උපකරණ කිහිපයක් ද සොයා ගෙන තිබේ. ආරෝග්‍යශාලාවේ කටයුතු සඳහා ජලය ලබා ගැනීමෙ දී ද නිසි ආකාරව ජල කළමනාකරණය කර ඇත. ආරෝග්‍යශාලාවේ පාරිසරික උපයෝගීතාව පිළිබඳව අවධානය යෙමු කිරීමේ දී ද්‍රව්‍ය උපයෝගී කර ගැනීම, පාරිසරික පිහිටීම උපයෝගී කර ගැනීම, ජල කළමනාකරණය ආදිය සංවිධානාත්මකව සිදු කර ඇත.

### සාරාංශය

මිහින්තලය ආරෝග්‍යශාලාව ඉදි කිරීමේ පාරිසරික උපයෝගීතාවය පිළිබඳ විමසීමේ දී භූමිය තෝරා ගැනීම, වෛද්‍ය උපකරණ සකස් කිරීම, ගොඩනැගිලි

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය , ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලයල ශ්‍රී ලංකාව ග

සකස් කිරීම හා ඖෂධයන් භාවිතා කිරීමේ දී ස්වභාවික පරිසරය නිසි අයුරින් කළමනාකරණය කර ඇත.

**මුඛ්‍ය පද**

පැරණි, රෝහල, පරිසරය, මිහින්තලය

**ආශ්‍රිත ග්‍රන්ථ**

පරණවිතාරණ, සෙනරත්, 2003, පුරාවිද්‍ය පර්යේෂණ, විසිදුණු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

ලගමුව, ආරිය, 2014, මිහින්තලේ පූජනිය සිද්ධස්ථාන හා පුරාවිද්‍යාත්මක ස්මාරක, කතෘ ප්‍රකාශනයකි.

හේරත් යමුනා, 2005, ආදි ලක්දිව මානව කටයුතු සඳහා ශාක භාවිතය, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, 675, පී ද ඇස් කුලරත්න මාවත, කොළඹ 10.

වික්‍රමගමගේ චන්ද්‍රා, 2004, රජරට ප්‍රවේණිය, ශ්‍රී ලංකා මහ බැංකු මුද්‍රණාලය, නො 58, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය.